---

**පානදුර ප්‍රාදේශීය සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 14 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ජනවාරි 14 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති පානදුර ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී තන්තිරිමුල්ල උප කාර්යාලය විසින් ඉඩම් හා ගොඩනැගිලි මිලදී ගැනීම්, ඉදිකිරීම් ප්‍රත්‍යාගණනය කිරීමකින් තොරව වත්කම් විෂයයන් 14 ක වටිනාකම රු.59,647,570 ක් වැඩියෙන්ද, විෂයයක වටිනාකම රු.2,350,000 ක් අඩුවෙන්ද රු.1,200,000 ක් වූ එක් වත්කම් විෂයයක් අතහැර ඉඩම් හා ගොඩනැගිලි ගිණුමේ ශේෂයට හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂයට ගලපා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී කර්මාන්ත ණයහිමියන් සඳහා ගෙවා තිබූ රු.2,262,201 ක් කර්මාන්ත ණයහිමි ගිණුම හර කිරීම වෙනුවට වර්ෂයේ වියදමක් ලෙස සළකා කර්මාන්ත වැය ගිණුම හර කර තිබුණි.

(ඇ) 2012 ජූලි 06 දින රු.10,900,000 කට මිලදී ගෙන තිබූ බැකෝ ලෝඩරයේ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ වැඩ සටහන් 01 හි වරෙන්තු ගාස්තු හා දඩ ආදායම රු.7,098,107 ක් විය යුතු වුවද, ආදායම් හා වියදම් ගිණුමට රු.7,924,966 ක් ගිණුම් ගත කර තිබීමෙන් වර්ෂයේ ආදායම රු.826,859 ක් වැඩියෙන් දැක්විණ.

(ඉ) ස්ථාවර තැන්පත් සඳහා 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලී රු.1,738,082 ක් ලැබිය යුතු පොලී ගිණුම හර කිරීම වෙනුවට ස්ථාවර තැන්පත් ගිණුම හර කර තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 292,936,504 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,342,720 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 38,521,937 ක් විය.

2.2 මූල්‍ය පාලනය

2012 දෙසැම්බර් 31 දිනට සභාවේ ගිණුම් 04 ක රු8,480,497 ක මුදල් ශේෂයක් නිරීක්ෂණය වූ අතර ඵලදායී ලෙස එම මුදල් ආයෝජනය කිරීමට පියවර ගෙන නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i.) | වරිපනම් හා බදු | 16,404 | 9,087 | 18,234 |
| (ii.) | බදු කුලී | 1,671 | 867 | 3,152 |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 596 | 591 | 8 |
| (iv.) | වෙනත් ආදායම් | 19,337 | 66,962 | 23,992 |

2:3:2 වෙළඳ ස්ථාන කුලී

(අ) වාද්දුව උප කාර්යාල බල ප්‍රදේශයේ පැරණි කඩ කාමර 04 කින් රු.107,639 ක්ද, I අදියර කඩ කාමරයකින් රු.45,135 ක්ද, II අදියර කඩ කාමරයකින් රු.47,700 ක්ද වූ හිඟ කුලී අයකරගැනීමට විගණිත දිනය වූ 2013 ජූනි 10 වන විටත් කටයුතු කර නොතිබූ අතර 2003 ජූලි 01 න් පසු කඩ කුලිය සම්බන්ධයෙන් තක්සේරුවක් කර කුලී සංශෝධනයක් කර නොතිබුණි.

(ආ) කඩ කාමරවල ගිවිසුම් වර්ෂ 10 කටත් වඩා පැරණි ඒවා වූ අතර අලුත් ගිවිසුම් අත්සන් කිරීමට පියවර ගෙන නොතිබුණි.

2:3:3 ඉඩම් විකිණීම් හා බදු

පහත සඳහන් නිරීක්ෂණයන් කරන ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව කට්ටි කර ඉඩම් විකිණීම්වලදී විකුණුම් මිලෙන් සියයට 1 ක බදු අයකළ යුතු වුවත් 2011, 2012 සහ 2013 වර්ෂවලදී රු.1,813,666 ක් අයකර ඇතත් එම මුදල ඇස්තමේන්තුගත මුදලින් සියයට 1 ක් වූ අතර කිසිදු අවස්ථාවක ඉඩමේ විකුණුම් වටිනාකමින් සියයට 1 ක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 සැප්තැම්බර් 27 දින ඔප්පු අංක 3703 මගින් පොදු පහසුකම් සඳහා ලබා දී තිබූ කහටගහවත්ත ඉඩමේ රූඩ් 1, පර්චස් 10.90 වූ කොටස පොදු පහසුකම් සඳහා යොදා ගෙන නොතිබූ අතර ඉඩමේ මායිම් වෙන් කරද නොතිබුණි.

(ඇ) කෝන්ගහකොටුව පාර ඉඩම 2012 වර්ෂයේ වෙන්දේසි කර තිබුණද විගණන දිනය වූ 2013 ජූනි 10 දින වන විටත් පොදු පහසුකම් සඳහා වෙන් කර තිබූ රූඩ් 01, පර්.04 ක් වූ ඉඩමේ ඔප්පුව සභාවට පවරා ගෙන නොතිබුණි.

2:3:4 බලපත්‍ර ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමත හෝටල්, ආපනශාලා, නවාතැන්පොල ආදායමින් සියයට 1 නොඉක්මවන ප්‍රමාණයක් බලපත්‍ර ගාස්තු ලෙස අයකර ගත යුතු බවට විධිවිධාන සලසා තිබුණද විගණිත දිනය වූ 2013 ජූනි 10 දින වන විටත් එවැනි ආයතන 02 කින් 2011 සහ 2012 වර්ෂ සඳහාත් ආයතන 07 කින් 2012 වර්ෂය සඳහාත් කිසිදු ගාස්තුවක් අයකර නොතිබුණි.

2:3:5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 8,431,116 |
| (ii) | මුද්දර ගාස්තු | 16,560,994 |

2.3.6 පරිසර ආරක්ෂණ බලපත්‍ර

2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් නිවේදනය මගින් නිකුත් කරන ලද මධ්‍යම පරිසර අධිකාරිය මගින් පළාත් පාලන ආයතනවලට බලතල පවරාදීම හා බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස් මාලාව ප්‍රකාරව පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කළ යුතු වුවත් 2008 සිට 2012 දක්වා කාලය තුළ පරිසර ආරක්ෂණ බලපත්‍ර අවලංගු වී තිබූ ආයතන 16 ක් සම්බන්ධයෙන් තවදුරටත් එම ආයතන පවත්වාගෙන යන්නේද පිළිබඳ තහවුරු කරගෙන නැවත බලපත්‍ර නිකුත් කිරීමට විගණන දිනය වූ 2013 ජූනි 10 දින වන විටත් පියවර ගෙන නොතිබුණි.

2.4 අවිධිමත් ගනුදෙනු

1997 අගෝස්තු 17 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ (බ.ප.) අංක 02/01/02/9/97 දරන චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව නිල ඇඳුම් හිමි නිලධාරීන් සඳහා නිල ඇඳුම් ලබාදීම වෙනුවට නිල ඇඳුම්ලාභීන් 151 ක් සඳහා මුදලින් රු.392,000 ක් ගෙවා තිබුණි.

2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් තිබෙන රු.1,717,893 ක් වූ පෙර ගෙවුම් ශේෂ සමාලෝචිත වර්ෂය අවසානයට වූ රු.41,919,189 ක ණයහිමි ශේෂය තුළ වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් තිබෙන රු 28,259,697 ක ශේෂය හඳුනා ගෙන නොතිබුණි.

(ආ) දීර්ඝ කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවත එන වාද්දුව උපකාර්යාලයේ හා ප්‍රධාන කාර්යාලයේ මියගිය හා ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 13 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.62,699 ක් වූ ණය ශේෂය අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2013 ජුනි 07 දින විදුලි භාණ්ඩ තොග භෞතික පරීක්ෂාවේදී එදිනට තොග ලෙජරයේ ශේෂයන් හා භෞතික ශේෂ අතර තොග විෂයයන් 08 ක රු.33,574 ක අතිරික්තයක්ද, තොග විෂයයන් 12 ක රු.80,123 ක ඌනතාවයක්ද විය.

(ඈ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගනක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ඉ) වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ වර්ෂයේ ඉටුකිරීමට අපේක්ෂිත කාර්යයන් සඳහන් කර තිබූ නමුත් එක් එක් කාර්යයන්ගේ මූල්‍යමය වටිනාකම හා ඉටුකරනු ලබන කාලපරාසයන් ඇතුළත් කර නොතිබු අතර වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ඊ) 2012 අයවැය ඇස්තමේන්තු ප්‍රකාරව වැය ශීර්ෂ 33 ක් සඳහා එකතුව රු.6,667,000 ක් වූ ප්‍රතිපාදන සළසා තිබූ නමුත් ඉන් කිසිදු මුදලක් වියදම් කර නොතිබීමෙන් අයවැයකරණය මගින් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

2.6 මාර්ග අළුත්වැඩියා කිරීම

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ මාර්ග නඩත්තු කිරීමේදී පෙරමුසු භාවිතා කිරීම වෙනුවට ගල් පස් (query muck) යොදාගෙන වලවල් වැසීම සිදු කර තිබූ අතර 2012 වර්ෂයේදී ගල්පස් කියුබ් 67 ක් මිලදී ගැනීම සඳහා රු.120,500 ක් වැය කොට තිබු අතර තොග ලේඛනයේ සටහන් කර තිබුණේ කියුබ් 24 ක් පමණි.

(ආ) තොග ලේඛනය අනුව 2012 වර්ෂය සඳහා ගල්පස් කියුබ් 07 ක් පමණක් නිකුත් කර තිබූ අතර ඉතිරි ප්‍රමාණය දැක්වෙන පරිදි ලේඛනය තුලනය කර නොතිබුණි.

(ඇ) මිලදී ගෙන තිබූ ගල් පස් කියුබ් 67 කුමන පාරවල් සඳහා මිලදී ගත්තේද යන්න සඳහන් නොවූ අතර ඒ සඳහා ඇස්තමේන්තුද නොතිබුණි.

---

2.7 වාහන පාලනය

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 1645(අ) අනුව වාහන සම්බන්ධයෙන් ලොග් පොත් පවත්වා තිබුණද ඒවායේ කිසිදු සටහනක් ඇතුළත් කර නොතිබුණි.

(ආ) 1990 ඔක්තෝබර් 10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 41/90 අනුව සංචිත වාහනවල මාස 6 කට වරක් ඉන්ධන දැවීම පරීක්ෂා කළ යුතු වුවත් සභාවේ කිසිදු වාහනයක් සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 1647(ආ) අනුව වාර්ෂිකව වාහන සම්බන්ධ සමීක්ෂණයක් පැවැත්විය යුතු වුවත් සභාව විසින් වාහන සමීක්ෂණයක් කර නොතිබූ අතර වාහන ලේඛනයක් වෙනම නඩත්තු කිරීමක්ද කර නොතිබුණි.

(ඈ) සභාවේ කිසිදු වාහනයක මාසික සාරාංශ සකස් කර නොතිබුණි.

2.8 අභ්‍යන්තර විගණනය

---------------------

සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) තොග පාලනය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඊ) අයවැයකරණය